**හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (ව්‍යාපෘති II) - 2019**

-----------------------------------------------------------------------------------------------------------------

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (ව්‍යාපෘති II) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක 3483 - එස්ආර්අයි සහ 3484- එස්ආර්අයි දරණ ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ ප්‍රංශ නියෝජිත ආයතනය අතර 2018 ඔක්තෝබර් 17 දින එළඹි අංක සීඑල්කේ 1022 01 කේ දරණ ණය පහසුකම් ගිවිසුමේ 03 ව්‍යවස්ථාවවේ 3.4.4 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

ණය ගිවිසුමට අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ පිවිතුරු විදුලිබල උත්පාදනය, පද්ධති කාර්යක්ෂමතාවය හා විශ්වාසනීය බව වැඩිදියුණු කිරීමයි. සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, මධ්‍ය වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂම බව වැඩිදියුණු කිරීම සහ විදුලිබල කාර්යක්ෂමතාවය සඳහා ඉල්ලුම් කළමනාකරණය යනාදී සංරචක 3 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 39,453 කට සමාන එජඩො මිලියන 264.7 ක් වන අතර, ඉන් රු. මිලියන 27,793 කට සමාන එජඩො මිලියන 184.7 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණු අතර රු. මිලියන 4,372.5 කට සමාන එජඩො මිලියන 30 ක් මූල්‍යයනය කිරීමට ප්‍රංශ නියෝජිත ආයතනය එකඟවී තිබුණි.ඉතිරි මුදල වන රු.මිලියන 80 ක් මූල්‍යනය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජූලි 10 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

වැඩසටහනේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ------------------------- | ------------- | ---------------------- | ------------------ |
| (අ) | වැඩසටහනේ ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා කිරීමට වෙනස් ප්‍රතිපත්ති දෙකක් යොදාගෙන තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට එක් පිරිවැය මධ්‍යස්ථානයක් පමණක් රු.මිලියන 2.2 ක් වටිනා ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණි. | වැඩසටහනේ වත්කම්වල නියම වටිනාකම පෙන්වා නොතිබුණි. | රු.මිලියන 2.2 වත්කම් මධ්‍ය වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහාම මිලදී ගෙන තිබුණු අතර පිරිවැය මධ්‍යස්ථානයේ වාර්තා කර රු. 977.00 ක්ෂය කර මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇත. එක ක්‍රමවේදයක් පවත්වා ගැනීමේ අරමුණින් වත්කම්වල පිරිවැය සහ සමුච්චිත ක්ෂය ප්‍රමාණය DD4 අංශයේ අතිරේක මූල්‍ය කළමනාකරු විසින් නඩත්තු කරන වත්කම් ලේඛනයට මාරු කිරීමට පියවර ගනු ලැබේ. | වැඩසටහන එහි වත්කම් පිළිබඳ වාර්තා කිරීමට එක ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |
| (ආ) | වැඩසටහනේ කාර්ය මණ්ඩලය වෙත වැඩසටහනේ අරමුදල් වලින් ගෙවන ලද රු.මිලියන 5.86 ක වාර්ෂික ප්‍රසාද දීමනා මූල්‍ය ප්‍රකාශනවල අක්‍රීය කාල ගිණුමට වැරදි ලෙස හර කර තිබුණි. | අක්‍රීය කාල ගිණුමේ ශේෂය වැඩියෙන් දැක්වේ. | ව්‍යාපෘති ගණකාධිකාරී පද්ධතියේ ශේෂ පිරික්සුමෙහි දත්ත ලබාගෙන ඇත. දෙන ලද ආකෘතියේ සංඛ්‍යා අතින් ඇතුලත් කර වෙනස් කර ඇත. වෙනස් කරන අවස්ථාවේදී රු.මිලියන 5.86ක ප්‍රසාද දීමනා ගෙවීම වැරදි ලෙස අක්‍රීය කාල ගිණුමට මාරු කර ඇත. කෙසේ වෙතත්, මෙම මුදල ප්‍රසාද හා සම්බන්ධ වන අතර ඉදිරියේ දී අක්‍රීය කාල ගිණුමේ නිවැරදි කිරීම් කරනු ලැබේ. | අදාල ලෙජර ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඇ) | 2019 සැප්තැම්බර් 5 දිනැති ණය අංක 3483/3484 (එස්එෆ්)-එස්ආර්අයි දරන සංශෝධිත ණය ගිවිසුම් අනුව වැඩසටහනේ ඉතුරුම් භාවිතයෙන් කිලෝවොට් 220/33 මන්නාරම් කොටුමා උපපොළ ඉදිකිරීම සඳහා ණය | මූල්‍ය ප්‍රකාශනවල වත්කම් හා වගකීම්වල නියම වටිනාකම නියෝජනය නොවේ. | එම වියදම් ඒ ව්‍යාපෘති සංරචකයට අදාල නිසා ණය ගිවිසුම් අංක 2892/2893 පිවිතුරු බලශක්තිය උදෙසා ජාල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ | මෙම සියළුම වියදම් වැඩසටහනේ ගිණුම් යටතේ වාර්තා කල යුතුය. |

ගිවිසුම් අංක 2892/2893 (පිවිතුරු බලශක්තිය උදෙසා ජාල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන) යටතේ ඉතිරි කටයුතු වැඩසටහන ආරම්භ කල යුතුවේ. ඒ අනුව, එකතුව එ.ජ.ඩො.මිලියන 1.6 ක් වැඩසටහනේ අරමුදල් මඟින් වැය කර තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල වියදම් වාර්තා කිරීම සඳහා නිසි ගිණුම්කරණය ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.

වැඩසටහනේ යටතේ ඉතිරි වැඩ සඳහා 2019 වර්ෂය තුලදී උපයෝජනය කරන ලද මුදල එම ණය අංක 2892/2893 යටතේ වාර්තා කර තිබුණු අතර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල (පිටු අංක 22) හි අනාවරණය කර ඇත.

**2.2** **රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති එම්ඕඑෆ්පී/ඊ්ආර්ඩී/2007/02 දරන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත 2019 මාර්තු 31 දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කල යුතු වුවද විගණනය සඳහා 2020 මැයි 28 දින ඉදිරිපත් කර තිබුණි. | නියමිත කාලය තුළ දී විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් සිදු වේ. | කොවිඩ් 19 ගෝලීය වසංගතය හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු නියමිත කාලයේ දී ඉදිරිපත් කිරීමට නොහැකි වීම. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වීම් අවශ්‍ය වේ. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 මාර්තු 24 දිනැති 01/2016 දරන චක්‍රලේඛයේ 09 වගන්තිය | ව්‍යාපෘති සමාලෝචන කමිටු ස්ථාපිත කර නොතිබුණි. | වැඩසටහන මඟින් ක්‍රියාත්මක කරන ලද කටයුතුවල භෞතික ප්‍රගතිය නිරන්තරයෙන් සමාලෝචනය කර නොතිබුණි. | සියළුම ව්‍යාපෘති සංරචක සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් මාසික ප්‍රගති සමාලෝචනය සිදුකරනු ලැබේ. තවද, බලශක්ති අමාත්‍යාංශය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති අධීක්ෂණය දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචනයන් සිදුකරනු ලැබේ. | ව්‍යාපෘති සමාලෝචන කමිටු ස්ථාපනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2016 ජූනි 15 දිනැති අංක ඩීඑම්ඒ/ඩී/2015 දරන චක්‍රලේඛය | වැඩසටහන සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | වැඩසටහනේ කටයුතු පිළිබඳ අධීක්ෂණ ක්‍රමවේදය දුර්වල මට්ටමක පැවතුණි. | වර්තමානයේ සඳහන් කරන ලද ව්‍යාපෘතියේ විගණනය ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ශාඛාව යටතේ පවතින අතර ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති අංශයට | වැඩසටහනේ ගනුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණනය කල යුතුය. |

අයත් සියළුම ව්‍යාපෘති අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම සඳහා වර්තමානයේ වගකියනු ලබන අභ්‍යන්තර විගණකවරයෙකු වෙත වෙන්කර ඇත. පවතින පසුබිම තුළ ක්‍රමානුකූල පදනමක් මත සිදුකරනු ලබන සාමාන්‍ය විගණනයන් වලට ව්‍යාපෘතිය යටතේ තිබුණු අතර වර්තමාන ප්‍රගතිය පිළිබඳ තත්ත්වය, කාර්යසාධනය, වත්කමේ උපයෝජනය සහ වියදම් යනාදිය විවිධ අංශවල කටයුතු පිළිබඳව අනෙකුත් ව්‍යාපෘති සමඟ නියැදි පදනම සමාලෝචනය කරනු ලැබේ. ඒ අනුව, මෙම ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව සතුටුදායක අධීක්ෂණයක් සිදුකර ඇති බව අපි විශ්වාස කරනු ලැබේ.

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 වැඩසටහනේ කටයුතු පිලිබඳව භෞතික සහ මූල්‍ය ප්‍රගතිය

ණය ගිවිසුමට අනුව, සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, මධ්‍ය වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂම බව වැඩිදියුණු කිරීම සහ විදුලිබල කාර්යක්ෂමතාවය සඳහා ඉල්ලුම් කළමනාකරණය යන ප්‍රධාන සංරචක 03 යටතේ වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු අතර කොන්ත්‍රාත් පැකේජ 07ක් යටතේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, 2016 ජුලි 31 සැලසුම් කල දින සිට වර්ෂ 02 ක ප්‍රමාදයන් සහිතව අදාළ කටයුතු ආරම්භ කර තිබුණු අතර ප්‍රමාදයන් ආවරණය කර ගැනීමට පියවර ගැනීමකින් තොරව කටයුතු අඛණ්ඩව සිදුකරනු ලැබේ. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | සංරචකය | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ------------- | ---------- | -------------------- | ----------------- |
| (අ) | **විදුලිබල කාර්යක්ෂමතාවය සඳහා ඉල්ලුම් කළමනාකරණය** | | | |
| | ස්මාර්ට් කොටුමා උපපොළ සහ මැනුම් සහ උපදේශන සේවය මත කොන්ත්‍රාත්තු ප්‍රදානය කර පසුව අතහැර දමා තිබුණු අතර නිසි හේතු දැක්වීමකින් තොරව වැඩසටහනේ විෂය පථයන් ඉවත් කර තිබුණි. | වැඩසටහනේ අරමුණු ලඟාකර ගැනීමට නොහැකි වේ. | 02 කොටසේ සැලසුම් කල වැඩ විෂය පථය සමස්ත කටුනායක (CSC) හි ස්මාර්ට් මිනුම් කිරීම වේ. ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 8.85 කි. (එජඩො මිලියන 8.1 භාණ්ඩ හා වැඩ සහ 0.75 උපදේශන සේවා) ඇස්තමේන්තු පළමු කොටසේ සැලසුම් අදියරේ පැවති තත්ත්වයන් මත වේ. උපදේශකවරයෙකුගේ සේවය නොමැතිව වෙනස් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග සහිතව සමාන වැඩ විෂය පථයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. තාක්ෂණික ඇගයීම් කමිටුව ලංසු ලියවිලි BPC අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට සැලසුම් කරමින් පවතී. නව ඇස්තමේන්තුව එජඩො මිලියන 3.27 වේ. (i) සඳහන් පිරිවැය වටිනාකම අවබෝධ කරගත නොහැක. අඩු පිරිවැයකට එක සමාන වැඩ විෂය පථයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | ඇල්ම ඇති පාර්ශවයන්ගේ අපේක්ෂාවන් සැලකිල්ලට ගත යුතු අතර වැඩසටහනේ සැලසුම් කළ කටයුතු ක්‍රියාත්මක කිරීමට අවශ්‍යය වේ. |

(ආ) **මධ්‍ය වෝල්ටීයතා ජාලයෙහි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම**

| | | | | |
|---|---|---|---|---|
| (i) | ලැබී තිබුණු තොරතුරු අනුව බෙලිගල සහ ඇතුල්කෝට්ටේ ප්‍රාථමික උපපොළවල් වැඩිදියුණු කිරීමේ සහ රත්නපිටිය ප්‍රාථමික උපපොළ ඉදිකිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමට වර්ෂ 2 ½ වඩා වැඩි කාලයක් ගෙන තිබුණි. 2019 නොවැම්බර් 14 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණද 2019 දෙසැම්බර් 31 දක්වා කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර නොතිබුණි. කෙසේ වෙතත්, ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය වර්ෂ 2 ½ වැඩි කාලයක් ගෙන තිබුණු අතර අදාළ අරමුණු සඳහා රත්නපිටිය තෝරාගත් ඉඩම විගණිත දිනය වූ 2020 ජුනි 01 දින තෙක් අත්කරගෙන නොතිබුණි. | වැඩසටහනේ කාලපරිච්ඡේදය දීර්ඝ කිරීමට සහ පිරිවැය ඉහළ යාමට ඉඩ ඇත. | ප්‍රාථමික උපපොළවල් සඳහා turnkey කොන්ත්‍රාත් සඳහා නව ලංසු ලියවිලි සකස් කිරිම සහ ඉඩම් මිලදී ගැනීම සහ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීම සඳහා කාලය ගතවීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රසම්පාදනයන් ආරම්භ කිරීම ප්‍රමාද විය. අයිතිය පිළිබඳ ගැටළු හේතුවෙන් රත්නපිටිය ප්‍රාථමික උපපොළ සඳහා ඉඩම් මිලදී ගැනීමේ ක්‍රියාවලිය අත්හිටුවීමට සිදුවිය. එම ඉඩම් කොටස් අත්පත් කර ගැනීම ආරම්භ කර ඇති අතර ප්‍රාථමික උපපොළ ඉදිකිරීම සඳහා අවසර ලබාදීමට ඉඩම් කොටස්වල භෞතික හිමිකාරීත්වය මාරුවන 38 (අ) වගන්තිය ප්‍රකාශයට පත්කර ඇත. පැකේජ 05 කොන්ත්‍රාත්තුව 2019 නොවැම්බර් පිරිනමා ඇත. 2019 නොවැම්බර් 18 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැර තිබීම නිසා සහ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ගමන් කිරීමට නොහැකි වීම හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද විය. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම ගෙවීමෙන් පසු සහ කොන්ත්‍රාත්තුවේ නියමයන් පරිදි ණයවර ලිපිය විවෘත කිරීමෙන් පසු කොන්ත්‍රාත්තුවේ බලපැවැත්වෙන දිනය ස්ථාපනය වේ. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (ii) | මධ්‍ය වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ සංරචකයේ පැකේජ 4 | වැඩසටහනේ කාලපරිච්ඡේදය දීර්ඝ කිරීමට සහ | PMU නිවැරදි අනුමත කිරීමෙ ක්‍රියාවලිය සිදුකල යුතු අතර ලංසු ලියවිලි | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර |

| | | | | |
|---|---|---|---|---|
| | යටතේ මහඉලුප්පල්ලම, ඇතාගල, වයිනා බේ සහ සූරිය වැව බෙදාහැරීමේ අංශයේ බෙදාහැරීමේ රැහැන් එළීමේ සහ මහඉලුප්පල්ලම, ඇතාගල, වයිනා බේ සහ වැනිවෙල්ආර ගැන්ට්‍රි ඉදිකිරීමේ භෞතික ප්‍රගතිය 23.5 ක් සහ මූල්‍ය ප්‍රගතිය සියයට 12.07 ක් විය. SCAPC සමඟ මිල ගණන් පිළිබඳ සාකච්ඡා පැවතීම හේතුවෙන් ඉදිකිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වැඩසටහනේ කටයුතු ආරම්භ කල දින සිට වර්ෂ 2 කට වඩා වැඩියෙන් ප්‍රමාද වී තිබුණි. තවද, ගිවිසුම් අත්සන් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2019 මැයි 16 දින පිරිනමා තිබුණද 2019 දෙසැම්බර් 31 දින තෙක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු බව අනාවරණය විය. | පිරිවැය ඉහළ යාමට ඉඩ ඇත. | ප්‍රවාරනයට පෙර රැහැන් මාර්ග සහ මූලික කටයුතු අවසන් කලයුතුය. සුදුසු ලංසුකරුවන් සමග පමණක් ලංසු වටිනාකම අඩුකිරීමට මිල ගණන් සාකච්ජා කිරීම සහ කොන්ත්‍රාත්තුවේ දේශිය සංරචකයේ වට්ටම් කල අයිතම් අනුව පිරිවැය නිමකිරීම හේතුවෙන් ලංසු ඇගයීම සහ සාකච්ජා කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය. AFD ණය ගිවිසුම අත්සන් කල පසු (2019 මැයි 03) 2019 මැයි 16 දින කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම ගෙවීමෙන් පසු සහ කොන්ත්‍රාත්තුවේ නියමයන් පරිදි ණයවර ලිපිය විවෘත කිරීමෙන් පසු කොන්ත්‍රාත්තුවේ බලපැවැත්වෙන දිනය ස්ථාපනය වේ. මෙම ප්‍රමාදය AFD ණය ගිවිසුම අනුව AFD මුදල් වියපැහැදම් කිරීම සඳහා විශේෂ විදේශ මුදල් ගිණුමක් ආරම්භ කිරීමේ ප්‍රමාදය හේතුවෙන් වේ. තවද, කොවිඩ් 19 හේතුවෙන් පැකේජ 4 වැඩ සැලැස්ම මාස 2 කින් දීර්ඝ කර ඇත. මෙම හේතු නිසා පැකේජ 4 අපේක්ෂිත නිම කිරීම් දිනය 2022 පෙබරවාරි 28 ලෙස සංශෝධනය කර ඇත. | කොන්ත්‍රාත්කරුගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ |
| **(ඇ)** | **සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම** | | | |
| (i) | වැඩසටහනේ ප්‍රගති වාර්තා අනුව පොල්පිටිය සිට හම්බන්තොට දක්වා කිලෝමීටර 144 ක සම්ප්‍රේෂණ ජාල එළීම යටතේ කටයුතු සහ පැකේජ 1 යටතේ කිලෝවොට් 132/32 හම්බන්තොට කොටුමා උපපොළ | වැඩසටහනේ කාලපරිච්ඡේදය දීර්ඝ කිරීමට සහ පිරිවැය ඉහළ යාමට ඉඩ ඇත. | පොල්පිටිය-හම්බන්තොට රැහැන් එළීමේ කොන්ත්‍රාත්තුව 2018 අගෝස්තු 08 දින සිට බලපැවැත්වෙන අතර 2021 ජනවාරි 23 දින නිමකිරීමට අපේක්ෂිතය. කෙසේ | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිකිරීම කටයුතු ප්‍රගතිය පිළිවෙලින් සියයට 37 සහ සියයට 26.8 ක් ලෙස ඉලක්කවලට පිටුපසින් පැවතුණි. කොන්ත්‍රාත් ගිවිසුම්වලට අනුව අදාල කොන්ත්‍රාත් කටයුතු බලාත්මක දින සිට වර්ෂ 2 ක් තුලදී නිමකල යුතු අතර වැඩසටහනේ කාලපරිච්ඡේදය තුලදී නිම කිරීම හැකියාව පිළිබඳ සැකයක් පවතී. | | වෙතත්, ව්‍යවස්ථාපිත අවශ්‍යතා සම්පූර්ණ කිරීමට මූලික රැහැන් මාර්ග සමීක්ෂණය, පාරිසරික නිශ්කාෂණය සහ රැහැන් මාර්ග අත්කර ගැනීම යම් කාලයක් ගත වී තිබේ. ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමෙන් පසු ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි නිම කිරීමට අපේක්ෂිතය. | |
| (ii) | වැඩසටහන් පරිපාලන අත්පොතට අනුව සම්ප්‍රේෂණ උප වැඩසටහනේ පැකේජ 2 යටතේ ඇස්තමේන්තුගත පිරිවැය එජඩො මිලියන 3.78 වටිනා පාදුක්ක සිට හොරණ දක්වා කිලෝමීටර 23.7 ක සම්ප්‍රේෂණ ජාල එලීමේ කොන්ත්‍රාත්තුව සහ ඇස්තමේන්තුගත පිරිවැය එජඩො මිලියන 3.21 වටිනා හබරණ සිට වාලච්චේන දක්වා කිලෝමීටර 100ක සම්ප්‍රේෂණ ජාල එලීමේ කොන්ත්‍රාත්තුව 2016 වර්ෂයේ හතරවන කාර්තුවේ පිරිනැමීමට අවශ්‍ය වේ. කෙටුම්පත් ලංසු ලියවිලි සකස් කිරීමේ ප්‍රමාදයන්, SCAPC සහ ADB මගින් කෙටුම්පත් ලංසු ලියවිලි සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා ප්‍රමාද වීම්, ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවරුන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග, ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සාමාජිකයින් පත්කිරීමේ ප්‍රමාදයන් යනාදී විවිධ හේතූන් නිසා එම කොන්ත්‍රාත් පිරිනැමීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය වර්ෂ දෙකකට වඩා ගත වී තිබුණි. කෙසේවෙතත්, පාදුක්ක සිට හොරණ දක්වා සම්ප්‍රේෂණ ජාල එලීමේ කොන්ත්‍රාත්තුව 2019 ජුනි 20 දින පිරිනමා තිබුණු අතර අනෙකුත් කොන්ත්‍රාත්තුව 2019 දෙසැම්බර් 31 දිනට පිරිනමා නොතිබුණි. පාදුක්ක සිට හොරණ දක්වා සම්ප්‍රේෂණ ජාල එලීමේ | වැඩසටහනේ කාලපරිච්ඡේදය දීර්ඝ කිරීමට සහ පිරිවැය ඉහළ යාමට ඉඩ ඇත. | හොරණ පාදුක්ක සහ හබරණ වාලච්චේනේ වැඩ දෙක AFD ණය මඟින් මූල්‍යායනය කෙරේ. AFD ණය 2019 මැයි සිට බලපැවැත්වේ. ඒ අනුව, කොන්ත්‍රාත් දෙකම 2019 ජුනි පිරිනමා තිබේ. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් අවශ්‍යතා සපුරමින් හබරණ වාලච්චේනේ කොන්ත්‍රාත්තුව 2019 නොවැම්බර් බලපැවැත්වේ. සම්ප්‍රේෂණ ජාල මාර්ගයට එරෙහිව මහජන විරෝධය හේතුවෙන් හොරණ පාදුක්ක කොන්ත්‍රාත්තුවේ බලපැවැත්වීම ප්‍රමාද විය. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | කොන්ත්‍රාත්තුව 2019 ජුනි 20 දී පිරිනමා තිබුණද ගිවිසුමේ මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දක්වා කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | | | |
| (iii) | වැඩසටහනේ ප්‍රගති වාර්තා අනුව පැකේජ 2 යටතේ නඩුකුඩා කොටුමා උපපොළ ඉදිකිරීම, මන්නාරම කොටුමා උපපොළ වැඩිදියුණු කිරීම සහ මන්නාරම සිට නඩුකුඩා දක්වා සම්ප්‍රේෂණ ජාල එලීම 2019 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 61.5 සහ සියයට 90.85 ක ඉලක්කවලට පිටුපසින් පැවතුණි. මේ සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන්, 2019 පාස්කු ප්‍රහාරය සහ කොවිඩ් 19 ව්‍යසනය වැනි විවිධ හේතූන් බලපා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඉදිකිරීම් කටයුතු 2020 මාර්තු අවසානය වන විට නිම කල යුතුව පැවතුණි. කෙසේවෙතත්, කටයුතු විගණිත දිනය වූ 2020 ජුනි 01 දින වන විටත් නිමකර නොතිබුණි. | වැඩසටහනේ කාලපරිච්ඡේදය දීර්ඝ කිරීමට සහ පිරිවැය ඉහළ යාමට ඉඩ ඇත. | කොවිඩ් 19, ADB සහ DWC මඟින් වැන්කලායි පක්ෂි අභයභූමියේ ඉදිකිරීම් සීමාකිරීම් හේතුවෙන් මන්නාරම, නඩුකුඩා සම්ප්‍රේෂණ ජාල එලීම නිමකිරීම 2020 මාර්තු සිට 2020 අගෝස්තු 17 දක්වා දීර්ඝ කර ඇත. කෙසේවෙතත්, සියළුම ඉදිකිරීම් කටයුතු 2020 අගෝස්තු 07 වන විට නිමකර ඇති අතර වර්තමානයේ බලශක්තිය නිපදවයි. කොවිඩ් 19, ශ්‍රී ලංකාවෙන් පිටත ආරම්භ කිරීමේ විශේෂඥයින්ගේ පැමිණීම සීමාකිරීම හේතුවෙන් නඩුකුඩා කොටුමා උපපොළ ඉදිකිරීම් නිමකිරීම 2020 මාර්තු සිට 2020 අගෝස්තු 18 දක්වා දීර්ඝ කර ඇත. | කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (iv) | පැකේජ 3 යටතේ කොළඹ බී කොටුමා උපපොළ ඉදිකිරීම, කොළඹ සී සිට කොලොන්නාව කොටුමා උපපොළ දක්වා තනි ඇතුළුවීමක් සහ පිටවීමක් ඉදිකිරීම සහ කොළඹ සී සහ කොලොන්නාව කොටුමා උපපොළවල් වැඩිදියුණු කිරීමේ කෙටුම්පත් ලංසු ලියවිලි ආසියානු සංවර්ධන බැංකුව විසින් 20 පෙබරවාරි 2017 අනුමත කර තිබුණද කෙටුම්පත් ලංසු ලියවිලි සකස් කිරීමේ ප්‍රමාදයන්, SCAPC සහ ADB මඟින් කෙටුම්පත් ලංසු ලියවිලි සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා ප්‍රමාද වීම, | වැඩසටහනේ කාලපරිච්ඡේදය දීර්ඝ කිරීමට සහ පිරිවැය ඉහළ යාමට ඉඩ ඇත. | කොළඹ බී AFD ණය මඟින් මූල්‍යායනය කරන අතර 2019 මැයි සිට ණය ගිවිසුම බලපැවැත්වේ. ඒ අනුව, කොන්ත්‍රාත්තුව 2019 ඔක්තෝබර් සිට බලපැවැත්වේ. ඉදිකිරීම කටයුතුවලට පෙර මූලික සැලසුම් කටයුතු, වැඩබිම් සමීක්ෂණය සහ පස පිළිබඳ විමර්ෂණය ආරම්භ කර ඇති අතර ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේවරුන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග, ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සාමාජිකයින් පත්කිරීමේ ප්‍රමාදයන් යනාදී විවිධ හේතූන් නිසා කොන්ත්‍රාත් පිරිනැමීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය වර්ෂ දෙකකට වඩා ගත වී තිබුණි. කොන්ත්‍රාත්තුව 2019 ජූලි 02 දින කොන්ත්‍රාත් වටිනාකම එජඩො මිලියන 3.7, යුරෝ මිලියන 3.1, CHF මිලියන 3 සහ රු. මිලියන 598.072 පිරිනමා තිබුණද ගිවිසුමේ මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දක්වා කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

## 3.2 ඌන උපයෝජිත සම්පත්

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| මුළු ප්‍රතිපාදනය රු.මිලියන 39,453කට සමාන එජඩො මිලියන 264.7 කින් 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 7,740 කට සමාන එජඩො මිලියන 53ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද, වැඩසටහනේ පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්කවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 27,751 කට සමාන එජඩො මිලියන 190.4ක් උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබුණු අතර එදිනට එම ඉලක්කයෙන් සියයට 28ක් පමණක් අත්කරගෙන තිබුණි. අරමුදල්වල මන්දගාමී උපයෝජනයේ ප්‍රතිඵලයක් ලෙස ණය නියෝජිත ආයතනය විසින් රු.මිලියන 30.06ක බැඳීම් ගාස්තු අයකරගෙන තිබුණි. | වැඩසටහනේ කාලය දීර්ඝ කිරීමට ඉඩ ඇත. | ADB එස්ආර්අයි 3484/3484 ණය ගිවිසුම් 2017 ජනවාරි බලපැවැත්වීමට අපේක්ෂිත වූ අතර කෙසේ වෙතත්, 2017 ජූලි සිට බලපැවැත්වුණි. AFD 8313 ණය ගිවිසුම 2019 මැයි බලපැවැත්විය. මූල් පාරිසරික නිශ්කාෂණය සහ ඉඩම් සමීක්ෂණය යම් කාලයක් ගත වී ඇත. ඒ අනුව, සියළුම ව්‍යාපෘතිවල වියපැහැදම් සැලැස්ම වෙනස් වී ඇත. පොලී ගාස්තු උපයෝජනය වූ අරමුදල් සඳහා ගෙවා ඇති අතර උපයෝජනය නොවූ අරමුදල් සඳහා බැඳීම් ගාස්තු ගෙවා ඇත. | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්ක සමඟ අනුකූල වීම අවශ්‍ය වේ. |

## 3.3 පරිබාහිර කටයුතු

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ------------- | ---------- | -------------------- | ----------------- |
| ලැබී තිබුණු තොරතුරු අනුව වැඩසටහනේ මෝටර් වාහන සෘජුව ආනයනය කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු හරහා මිලදී ගෙන තිබුණි. ඒ හේතුවෙන් වැඩසටහනේ කොන්ත්‍රාත්කරුගේ ලාභාන්තිකය සහ පොදුකාර්යය පිරිවැය ඇතුළුව මෝටර් වාහනවල ඉන්වොයිසි වටිනාකමට වඩා ගෙවීමට සිදු වී තිබේ. 2016 සිට 2019 දක්වා කාලපරිච්ඡේදය තුලදී මෝටර් වාහන 28ක් මිලදී ගැනීමට වැඩසටහන මගින් එකතුව රු.මිලියන 165.707ක් ප්‍රතිපූර්ණය කර තිබුණිද වාහනවල අයිතිය කොන්ත්‍රාත්කරු සතුව පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත් වැඩ නතර කිරීම හෝ අනතුරකින් පසු භාවිතයෙන් ඉවත් කිරීමට සිදු වුවහොත් වැඩසටහනට පාඩුව දැරීමට සිදුවේ. තවද, කොන්ත්‍රාත්කරු විසින් වාහන සපයන තෙක් 2019 දෙසැම්බර් 31 දිනට කුලී ගාස්තු ලෙස පෞද්ගලික පාර්ශවයන් වෙත එකතුව රු.මිලියන 17.65ක් ගෙවා තිබුණි. | දරන ලද වියදම් ව්‍යාපෘතියේ අරමුණු අත්කර ගැනීමට අදාළ නොවේ. | මේවා එකවර ගෙවන EPC කොන්ත්‍රාත් වන අතර සෑම මිල කළ අයිතමයකම ඔවුන්ගේ ලාභය සහ පොදුකාර්යය පිරිවැය ඇත. එම නිසා, මිලකල අයිතමයන් සත්‍ය මිල නොදැක්වෙන් අතර කොන්ත්‍රාත්කරු විසින් ඔවුන්ගේ මුදල් ප්‍රවාහය සලකමින් අයිතමයන් මිල කර ඇත. මිල කළ සෑම අයිතමයකම ව්‍යාපෘතියේ වාහන සහ අනෙකුත් වත්කම් ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු ලංකා විදුලිබල මණ්ඩලයට මාරු කරනු ඇත. බෙදාහැරීම් අංශ 04 යටතේ PMU අලුතින් පිහිටුවීම නිසා මූලික කටයුතු සඳහා භාවිතා කිරීමට කිසිදු පැරණි වාහන නොතිබුණි. එම නිසා මූලික කටයුතු ආරම්භ කිරීම සඳහා PMU ආරම්භ කිරීමේ සිට කොන්ත්‍රාත් පිරිනමන තෙක් කාලය සඳහා සීමිත ප්‍රමාණයක කුලියට ගත් වාහන භාවිතා කර ඇත. සඳහන් කර ඇති මුදල කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර මුළු වටිනාකම වේ. | වත්කම් කළමනාකරණය පිළිබඳව පාලනයන් ශක්තිමත් කළ යුතු වේ. |

## 3.4 පද්ධති හා පාලනයන්

| | විගණන ගැටළු | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ------------- | ---------- | -------------------- | ----------------- |
| (අ) | ප්‍රධාන සංරචක 03 යටතේ ව්‍යාපෘතියේ කටයුතුවල අධීක්ෂණය සහ නියාමනය ලංකා විදුලිබල මණ්ඩලයේ වෙනම අංශ ප්‍රධානීන් තිදෙනෙකු යටතේ පවතී. නිසි | ව්‍යාපෘතියේ කටයුතුවල අධීක්ෂණය දුර්වල වේ. | සියළුම ව්‍යාපෘති සංරචක සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් මාසික ප්‍රගති සමාලෝචනය සිදුකරනු ලැබේ. තවද, විදුලිබල අමාත්‍යාංශය | අධීක්ෂණය සහ නියාමනය පිළිබඳව පාලනයන් ශක්තිමත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | සම්බන්ධීකරණයක් නොමැති වීම හේතුවෙන් වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්ට එය හේතු වී තිබුණි. | | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ මහ භාණ්ඩාගාරය ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති ප්‍රගති සමාලෝචනයන් සිදුකරනු ලැබේ. | |
| (ආ) | 2018 ඔක්තෝබර් 17 දිනැති සීඑල්කේ/1022 01 කේ දරන ණය ගිවිසුම අනුව ප්‍රංශ නියෝජිත ආයතනය වැඩසටහන සඳහා යුරෝ මිලියන 30 ක් ප්‍රදානය කිරීමට එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, 2019 මූල්‍ය ප්‍රකාශන යුරෝ මිලියන 30 වැරදි ලෙස එජඩො මිලියන 30 ලෙස හෙළිදරව් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වැරදි ලෙස දැක්වීම. | - | වැරදි ලෙස දක්වන ලද සියළුම වාර්තා නිවැරදි කළ යුතුය. |